ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

අවසාන පරීක්ෂණය - 2007

**ESD 1132 -** විෂයමාලා අධ්‍යයනය සහ ප්‍රායෝගික වැඩ- සෞන්දර්ය සහ නිර්මාණාත්මක අධ්‍යයනය

කාලය - පැය දෙකයි.

---

දිනය - 2007.12.09 වේලාව - ප.ව.02.00 - ප.ව.04.00

---

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු ලියන්න.

01. i. සංගීතය හා රිද්මයානුකූල චලන මගින් දරුවන් තුළ වර්ධනය වන චතුර්විධ හැකියා නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. ඉන් එක් හැකියාවක් තෝරාගෙන දරුවා තුළ මෙම හැකියාව වර්ධනය වන ආකාරය විස්තර කරන්න.

(ලකුණු 15)

02. i. හොවාර්ඩ් ගාඩ්නර් ඉදිරිපත් කළ බහුවිධ බුද්ධි න්‍යාය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. දරුවන් තුළ සංගීතමය බුද්ධිය උත්පාදනය කිරීමේ දී සැලකිය යුතු කරුණු මොනවාදැයි විග්‍රහ කරන්න.

(ලකුණු 15)

03. i. සංගීත හා චලන වර්ධනයේ මූලික අවස්ථා වලින් ඔබ කැමති එක් වර්ධන අවධියක් තෝරා ගන්න.

(ලකුණු 08)

ii. එම ළදරුවන් තුළ සංගීත හා චලන වර්ධන අවධියේදී ඇතිවන චර්යාමය ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 17)

04. i. සංගීත හා රිද්මයානුකූල චලන තුළින් දරුවාට ඉගෙන ගත හැකි වෙනත් විෂයක් නම් කරන්න.

(ලකුණු 02)

ii, එම විෂයෙහි ස්වභාවය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

iii. එම විෂයට අදාළ ඉගෙනුම්-ඉගැන්වීම් අත්දැකීම් ලබා දීම සඳහා දරුවා සමග ඔබ ක්‍රියාකාරකම් සංවිධානය කරන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 15)

05. "කතාන්දර ක්‍රමය යොදා ගැනීමෙන් එක් අරමුණක් වන්නේ දරුවා තුළ සදාචාර චර්යාවන් වර්ධනය කිරීමයි."
මෙම කියමනට ඔබ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 25)

06. ළමා චිත්‍ර හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් දරුවන්ගේ මානසික හා කායික සංවර්ධනයට දායක වන ආකාරය සුදුසු නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 25)

\- හිමිකම් ඇවිරිණි. -